# ශ්‍රී ලංකාවේ ජීවත් වන LGBT ප්‍රජාවගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් : සංක්ෂිප්ත ප්‍රමාණාත්මක පර්යේෂණයක්

Équité
ශ්‍රී ලංකා HUMANITY for ALL

# පෙරවදන

ÉQUITÉ Sri Lanka අලුතින්ම සිදු කරන ලද "A Brief Quantitative Research: Civil and Political Rights of the LGBT Community Living in Sri Lanka" පර්යේෂණ වාර්තාව ඔබ සමග බෙදාගනු ලබන්නේ ඉමහත් සතුටිනි. මෙම පර්යේෂණ වාර්තාව ශ්‍රී ලංකාවේ ජීවත්වෙන LGBTIQ+ ප්‍රජාවගේ අයිතිවාසිකම් දිනාගැනීමේ උත්සාහයට විශාල වටිනාකමක් එක් කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

ශ්‍රී ලංකාවේ LGBTIQ+ ප්‍රජාවගේ අයිතිවාසිකම් දිනාගැනීමේ සටන වර්තමානය වන විට වඩාත් පුළුල් වෙමින් තිබෙන අතර, පසුගිය වසර 7ක පමණ කාලය තුළ ප්‍රජාවක් වශයෙන් අප බොහෝ දේ ජයග්‍රහණය කර ඇත. LGBTIQ+ ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාකරන ප්‍රජා සංවිධාන, සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය සහ වෙනත් පාර්ශ්වකරුවන්, තනි පුද්ගල ක්‍රියාකාරීන්, මානව හිමිකම් කොමිෂන් සභාව මෙන්ම විශ්වවිද්‍යාල වැනි ආයතන මේ සම්බන්ධයෙන් දැක්වූ සහයෝගය අතිමහත්ය

LGBTIQ+ ප්‍රජාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින්, රාජ්‍ය නිලධාරීන් හා නීතිමය ප්‍රතිසංස්කරණ සිදුකරන ආයතන සහ පුද්ගලයින් සමග පසුගිය කාල සීමාවේදී සිදුකරනු ලබන බොහෝ සාකච්ඡා වලදී ඔවුන් අසමින් සිටියේ සංඛ්‍යාත්මක දත්ත පිළිබඳවයි. ඉදිරියේදී, LGBTIQ+ ප්‍රජාවේ අධ්‍යාපනය, රැකියා, සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් සහ සෞඛ්‍ය සම්බන්ධව අයිතිවාසිකම් දිනාගැනීමේ සාකච්ඡාවලට මෙම පර්යේෂණ වාර්තාව ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත. වෙනත් සිවිල් සමාජ සංවිධානවලට, විශ්වවිද්‍යාලවලට සහ LGBTIQ+ ප්‍රජාව සම්බන්ධයෙන් අධ්‍යයනය කරනු ලබන අයට මෙම පර්යේෂණ වාර්තාව විශාල ආලෝකයක් සපයනු ඇත.

ÉQUITÉ Sri Lanka ආරාධනයෙන් මෙම පර්යේෂණය සිදු කිරීමට බාරගත් සමාජ විද්‍යාඥයින්ගේ සංගමයට සමස්ත LGBTIQ+ ප්‍රජාවගේ ස්තුතිය හිමිවේ. පර්යේෂණ වලට සහභාගී වීමට එතරම් අකමැති සහ බාහිර සමාජයට නිරාවරණය නොවන ආන්තිකරණයට ලක් වූ ප්‍රජා කණ්ඩායම් ජාලයක් අතුරින් 856 දෙනෙකු අධ්‍යයනයට ලක් කර ගැනීමට හැකිවීම ඔවුන් ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය යුතුය.

මෙම පර්යේෂණය සැලසුම් කිරීම, පර්යේෂණ ක්ෂේත්‍රය තෝරාගැනීම මෙන්ම පර්යේෂණයේ දළ වාර්තාවට ප්‍රතිචාර දැක්වීම යනාදී පියවරයන්හිදී සහාය දැක්වූ උපදේශක මණ්ඩලයට ද අපගේ ස්තුතිය හිමිවේ.

මෙම පර්යේෂණයට සිදුකිරීමට අමතරව 2023 ශ්‍රී ලංකා LGBTIQ+ ප්‍රජා අභිමානය සැමරීමේ නුවරඑළිය උත්සවය, ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම වෙනුවෙන් යාපනයේ පැවැත්වූ සංස්කෘතික මංගල්‍යය යන සියල්ල සඳහා ව්‍යාපෘති ආධාර ලබාදුන් ශ්‍රී ලංකාවේ කැනඩා මහකොමසාරිස් කාර්යාලයට අපගේ ස්තුතිය පිරිනැමේ.

තුෂාර මනෝජ්
සභාපති
ÉQUITÉ Sri Lanka

## පටුන

**දැනුවත් කිරීම ........ 5**

**විධායක සාරාංශය ........ 6**

**හැඳින්වීම ........ 8**

**ක්‍රමවේදය ........ 11**

**පළමුවැනි පරිච්ඡේදය: ප්‍රතිචාර දක්වන්නන්ගේ පුද්ගල විස්තර ........ 13**

සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය ........ 13

**වයස** ........ 15

ජාතිය ........ 16

**දෙවැනි පරිච්ඡේදය : රැකියා සම්බන්ධ අත්දැකීම් ........ 17**

ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය රැකියාවක් ලබාගැනීමට බාධාවක්ද?**........20**

වර්තමාන හෝ පෙර සේවා ස්ථානයකදී තරගකාරී වැටුපක් ලබාගැනීමට ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය බාධාවක් වූවාද? ........ 21

**තුන්වැනි පරිච්ඡේදය: දේශපාලන සහභාගීත්වය ........ 24**

දේශපාලන රැස්වීම්/රැලිවලට සහභාගී වීම ........ 25

විරෝධතාවලට සහභාගී වීම ........ 25

ගැටලුවක් විසඳාගැනීමට රජයේ නිලධාරියෙකු හමුවීම ........ 27

දේශපාලනය පිලිබඳ ඇති උනන්දුව ........ 34

මැතිවරණවලට සහභාගී වීම ........ 35

ඡන්දය ප්‍රකාශ කිරීමේදී මුහුණදුන් දුෂ්කරතා ........ 36

**සිව්වැනි පරිච්ඡේදය: අධිකරණ පද්ධතිය සහ නීතියේ ආධිපත්‍යය ........ 40**

පොලිසිය සමග ඇති අත්දැකීම් ........ 40

පොලිසිය විසින් සැලකූ ආකාරය ........ 43

ඔබට නරක ලෙස සැලකුවා නම් ඔබ ප්‍රතිචාර දැක්වූයේ කුමක්ද? ....... **Error! Bookmark not defined.**

පොලිසියට යාමෙන් වැළකීම ........ 46

පොලිසියට යාම නැවත්වීමට හේතු ........ 47

පොලිසියට නොගියේ නම් වෙනත් තැනකින් සහය ලබාගැනීම ........ 48

අධිකරණය සමග අත්දැකීම ........ 49

අධිකරණයට යාමට හේතුව ........ 51

විනිසුරුවන් සලකන අකාරය ........ 53

උසාවි යෑමෙන් වැළකී සිටීම පිළිබඳ මතය ........ 54

**පස්වැනි පරිච්ඡේදය: රාජ්‍ය ආයතන සහ ක්‍රියාවලි සමග සම්බන්ධ වීම සම්බන්ධ අත්දැකීම ........ 58**

ග්‍රාම නිලධාරී .......... 58

රජයේ කාර්යාලය (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නීතිපති, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව)... 61

හැඳුනුම් ලේඛන සතු වීම: .......... 65

**සයවැනි පරිච්ඡේදය: අධ්‍යාපනය .......... 68**

පාසලේදී ලැබුණු සැලකීම .......... 71

පන්තියේ සෙසු ශිෂ්‍යයින් .......... 71

පාසලේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින් .......... 72

ගුරුවරු .......... 74

අනධ්‍යයන කාර්ය මණ්ඩලය .......... 75

ඔබ පාසැලේ ගත කළ කාලය ගැන සිතන විට, ඔබට සිතිය හැකි නරකම අත්දැකීම කුමක්දැයි පැහැදිලි කළ හැකිද? .......... 77

පාසල් ක්‍රියාකාරකම් වලට සහභාගී වීම .......... 78

ක්‍රීඩා .......... 78

සංගම් සහ සමිති කටයුතු .......... 79

විවිධ තරඟ .......... 81

**හත්වැනි පරිච්ඡේදය: පදිංචිය සහ යටිතල පහසුකම් .......... 83**

ඔබ දැන් ජීවත් වන්නේ කා සමඟද? .......... 83

දැනට ජීවත් වන්නේ පවුල සමඟ නොවේ නම්, නවාතැන් සොයා ගැනීම කොතරම් පහසු හෝ දුෂ්කරද වූවාද? .......... 84

ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් පොදු ප්‍රවාහනය භාවිතා කිරීමේ දුෂ්කරතා .......... 85

**අටවැනි පරිච්ඡේදය: සෞඛ්‍ය .......... 90**

වෛද්‍ය ප්‍රතිකාර .......... 92

රෝහල් සහායකයින් විසින් දක්වන සැලකිල්ල .......... 93

ආරක්ෂක නිලධාරීන්ගෙන් ලැබෙන සැලකිල්ල .......... 94

ඖෂධවේදීන් විසින් දැක්වූ සැලකිල්ල .......... 95

රෝගීන්ගෙන් ලැබුණු සැලකිල්ල .......... 96

සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති ප්‍රවේශය: .......... 97

සේවා දැරිය හැකි මිලකට ලැබීම .......... 99

## දැනුවත් කිරීම

මෙම සමීක්ෂණයට සහභාගී වූ **LGBTIQ+** ප්‍රජාවේ ප්‍රතිචාර දක්වන්නන්ට සහ දත්ත රැස් කළ අයට  අපගේ අවංක කෘතඥතාවය පළ කරමු. විවිධ සංවිධාන වෙතින් සහ පුද්ගලයින්ගෙන් **LGBTIQ+** ප්‍රජාව නියෝජනය කරමින් ප්‍රතිචාර දක්වන්නන්  සමග ජාලගත වීමට සහ සම්බන්ධ වීමට ලැබුණු අතිමහත් සහය නොමැතිව මෙම අධ්‍යයනය සිදුකිරීමට නොහැකි වීමට ඉඩ තිබිණ. මෙවැනි අධ්‍යයනයක් සිදුකිරීම සඳහා එක්ව වැඩ කිරීමට අවස්ථාවක් ලබාදීම සම්බන්ධයෙන් **Équité Sri Lanka** ආයතනයටද අප ස්තූතිවන්ත වෙමු.

සමාජ විද්‍යාඥයින්ගේ  සංගමය

මෙම පර්යේෂණය සිදුකළේ සහ වාර්තාව සකස් කළේ සමාජ විද්‍යාඥන්ගේ සංගමය විසිනි.

සිංහල පරිවර්තනය - සුමුදු චාමර
පරික්ෂා කළේ - තුෂාර මනෝජ්
දෙමළ පරිවර්තනය - ප්‍රියදර්ශිනි  ශිවරාජා
පරික්ෂා කළේ : නදීෂා ඉලංගෝවන්

## විධායක සාරාංශය

- රැකියා විරහිතභාවයෙන් පසුවන බව පැවසූ 11.3% ක් පමණ වන ස්ත්‍රීතික සමාජභාවිය (සංක්‍රාන්ති සමාජභාවී නොවන) ප්‍රජාවට සාපේක්ෂව, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට අයත් තරුණ පිරිසෙන් ඉහළ ප්‍රතිශතයක් (15.9%) එම මතයම ප්‍රකාශ කරන ලදී.
- ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, හෝ ද්විරිසි පිරිමි හෝ ගැහැණුලෙස තමන්ව හඳුන්වාදුන් පිරිසගේ දත්ත විශ්ලේෂණය කිරීමේදී, රැකියාවක් ලබාගැනීමේදී තමන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය ගැටලු ඇතිකළ බව වැඩියෙන්ම සඳහන් කර ඇත්තේ ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි ගැහැණු පුද්ගලයින් (28.6%) බව පැහැදිලි වේ.
- ස්ත්‍රීතික සමාජභාවිය ප්‍රජාව සැලකිල්ලට ගත් විට, තමන් දැනට නියුතුව සිටින රැකියාව තමන් කැමති රැකියාව නොවන නමුත් ඒ තමන්ට ලබාගැනීමට හැකිවූ එකම රැකියාව බව පැවසූ පිරිස අතර ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි පිරිමි පුද්ගලයින් වැඩිදෙනෙක් සිටින බව පෙනේ.
- සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සැලකිල්ලට ගත් කළ, තමන් දැනට නියුතුව සිටින රැකියාව කිරීමට පීඩනයක් එල්ල වූ බව පැවසූ පුද්ගලයින් අතර වැඩියෙන්ම සිටින්නේ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි (පිරිමි/ගැහැණු) පුද්ගලයින් ය.
- ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි ගැහැණු, ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි පිරිමි සහ ස්ත්‍රීතික සමාජභාවිය ද්විරිසි පිරිමි/ගැහැණු සහ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු, සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි පිරිමි/ගැහැණු පුද්ගලයින්ගෙන් සැලකියයුතු ප්‍රතිශතයක් තමන් දේශපාලනය පිළිබඳ උනන්දුවක් නොදක්වන බව පවසා තිබේ.
- ස්ත්‍රීතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන්ගෙන්, තමන් ජීවත්වන ප්‍රදේශයේ පැවැත්වූ දේශපාලන රැස්වීම්/රැලි වලට සහභාගී වී නොමැති බව වැඩිපුරම පැවැසුවේ සමරිසි ගැහැණු (58.2%) සහ ද්විරිසි පිරිමි/ගැහැණු (54.9%) ප්‍රජාවන් ය. සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේදී පෙනී යන්නේ මෙම මතය වැඩිපුරම දරන්නේ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි වන ප්‍රතිචාර දක්වන්නන් (62.1%) බවයි.
- ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි පිරිමි සහ ද්විරිසි පිරිමි/ගැහැණු පිරිසට වඩා වැඩි සමරිසි ගැහැණු ප්‍රතිචාර දක්වන්නන් ප්‍රතිශතයක් විරෝධතාවලට සහභාගී වී නොමැති බව පවසයි.
- වෙනස්කොට සැලකීම් හෝ අසාධාරණයට ලක්වීම පිළිබඳ අත්දැකීම් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට දේශපාලකයෙකු හෝ රජයේ නිලධාරියෙකු හමුවී නොමැති බව පැවසූ පුද්ගලයින්ගෙන් බහුතරයක් ස්ත්‍රීතික සමාජභාවිය -සමරිසි ගැහැණු, සංක්‍රාන්ති සමාජභාවී විෂමරිසි, සහ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි අය වේ.
- 2020 වසරේ අගෝස්තු මස පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයට සහභාගී නොවූ බව පවසන පුද්ගලයින්ගෙන් ඉහළ ප්‍රතිශතයක් සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව තුළින් වාර්තා විය.
- අවසාන මැතිවරණය (2020 වසරේ අගෝස්තු වල පැවැත්වූ) අතරතුරදී ඡන්දය ප්‍රකාශ කිරීමේදී මුහුණ පෑ ගැටලු පිළිබඳව පැහැදිලි කිරීමට ඉදිරිපත් වූ පුද්ගලයින් හෙළි කලේ තමන්ගේ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය හේතුවෙන් වෙනස්කොට සැලකීමට මුහුණ පෑ බවත්, නිදහස අඩු බවක් දැනුණු බවත් ය.
- තවද, ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි ගැහැණු සහ සමරිසි පිරිමි මෙන්ම සංක්‍රාන්ති සමාජභාවී සමරිසි ගැහැණු, සමරිසි පිරිමි සහ විෂමරිසි ප්‍රජාවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් පවසා තිබුණේ මීට පෙර අවස්ථාවලදී ඡන්ද මධ්‍යස්ථානවල සිටි පුද්ගලයින් තමන්ව ලිංගිකව අපයෝජනයට ලක් කළ බවත්, ඒ හේතුවෙන් 2020 වසරේ අගෝස්තු මස පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී ඔවුන් ඡන්දය ප්‍රකාශ නොකළ බවත් ය.
- ස්ත්‍රීතික සමාජභාවිය ප්‍රජාවට අයත් ප්‍රතිචාර දක්වන්නන්ගෙන් පොලිසිය තමන්ට නරක ආකාරයට සැලකූ බව පැවසූ බහුතරයක් දෙනා සමරිසි පිරිමි පුද්ගලයින් වේ.

- පොලිසියේ සහය ලබාගැනීමට පොලිසියට යාමෙන් වැළකී සිටි බව පැවසූ පුද්ගලයින්ගෙන් බහුතරයක් ස්ථිතික සමාජභාවිය සමරිසි ගැහැණු සහ සංක්‍රාන්ති සමාජභාවී සමරිසි පිරිමි ප්‍රජාව නියෝජනය කරයි.
- අවශ්‍යතාවක් තිබූ නමුත් පොලිසියට යාමෙන් වැළකී සිටි ප්‍රතිචාර දක්වන්නගෙන් ස්ථිතික සමාජභාවිය ප්‍රජාවට අයත් බහුතරයක් (44%) පවසන්නේ තමන්ට පොලිසියට යාමට තරම් පහසුවක් නොදැනුන නිසා ඔවුන් එසේ නොකළ බවයි.
- සමස්තයක් වශයෙන් ගත් කළ, සංක්‍රාන්ති සමාජභාවී සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, ද්විරිසි සහ විෂමරිසි ප්‍රතිචාර දක්වන්නන් අතරින් වැඩි පිරිසක් (29%) පෙන්වා දෙන්නේ ඔවුන් අධිකරණයට යාමට හේතුව වූයේ ඔවුන්ට විරුද්ධව නඩුවක් ගොනුකර තිබීම බවයි.
- තමන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය හෙළිකිරීම නීතිමය විසඳුම් ලබාගැනීමේදී අවාසිදායක වනු ඇති බව වැඩි සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන් පිරිසක් (56%) පවසයි.
- නීතිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී තමන්ගේ සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික දිශානතිය පිළිබඳ හෙළිකිරීමට අනාරක්ෂිත බවක් දැනුණු බව පැවසූ පුද්ගලයින් අතර බහුතරයක් සිටින්නේ ස්ථිතික සමාජභාවිය සමරිසි පිරිමි (31.4%) ප්‍රජාව නියෝජනය කරන අයයි.
- සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු (35.3%) සහ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි පිරිමි හෝ ගැහැණු (33.3%) පුද්ගලයින්ගෙන් ඉහළ ප්‍රතිශතයක් නවාතැනක් සොයාගැනීමේදී මුහුණ පෑ ගැටලු පෙන්වා දෙන ලදී.
- පොදු ප්‍රවාහන ක්‍රම භාවිතා කිරීමේදී තමන්ගේ ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් තමන් අපහසුතාවන්ට මුහුණ දී ඇති බව සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි (46.6%) සහ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි (42.9%) ප්‍රජාවන් නියෝජනය කළ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් වැඩි පිරිසක් පවසා ඇත.
- ස්ථිතික සමාජභාවිය සමරිසි පිරිමි සහ ද්විරිසි ප්‍රතිචාර දක්වන්නන්ට වඩා වැඩි සංක්‍රාන්ති සමරිසි ගැහැණු අය සංඛ්‍යාවක් පොදු වැසිකිලිවලට ප්‍රවේශ වීම "ඉතාමත් අපහසු" (8.2%) හෝ "යම්තාක් දුරකට අපහසු" (30.6%) යැයි දක්වා තිබිණ.
- වෙන් වෙන් ලෙස දක්වා ඇති දත්ත දෙස බැලීමේදී පෙනී යන්නේ, සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි ප්‍රතිචාර දක්වන්නන්ට වඩා වැඩි සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු පුද්ගලයින් සංඛ්‍යාවක් පොදු වැසිකිලිවලට ප්‍රවේශ වීම "ඉතාමත් අපහසු" (17.2%) සහ "යම්තාක් දුරකට අපහසු" (55.2%) යැයි පවසා තිබිණ. තවද, සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි ප්‍රතිචාර දක්වන්නන්ට වඩා වැඩි සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු පුද්ගලයින් සංඛ්‍යාවක් පවසා තිබුණේ ඇඳුම් මාරුකරන කුටිවලට ප්‍රවේශ වීම "ඉතාමත් අපහසු" (24.1%) හෝ "යම්තාක් දුරකට අපහසු" (55.2%) බවයි.
- ලිංගික සංක්‍රාන්ති සැත්කම්වලට සහ ඒ ක්‍රියාවලියට උදව් වන සෞඛ්‍ය සේවාවලට ප්‍රවේශ වීම, හෝ ලිංගික සංක්‍රාන්ති සැත්කම්වලට සහ ඒ ක්‍රියාවලියට පහසුකම් සපයන හෝමෝන පෙති වැනි අවශ්‍ය ඖෂධ ලබාදෙන සෞඛ්‍ය සේවා සපයන්නන්ට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ගත් කළ, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ සැලකියයුතු ප්‍රතිචාර දක්වන්නන් ප්‍රතිශතයක් පෙන්වූයේ එය ලබාගැනීම අපහසු බවයි.
- ස්ථිතික සමාජභාවිය සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන් දෙකෙන්ම සැලකිය යුතු කොටසක් දරන මතයක් වන්නේ මානසික සෞඛ්‍ය සම්බන්ධ සේවාවලට ප්‍රවේශ වීම අසීරු බවයි.

## හැඳින්වීම

පසුගිය වසර කිහිපය තුළ ගෝලීය මට්ටමින් LGBTIQ+ ප්‍රජාවට ඇති තත්වයේ සැලකිය යුතු වර්ධනයක් සිදුව ඇති අතර, එය ඔවුන්ගේ අයිතීන් සහ වරප්‍රසාද වැඩිදියුණු කිරීමට ගත් ප්‍රයත්නවල ප්‍රතිඵලයකි. LGBTIQ+ පුද්ගලයින්ට සැලකීම සම්බන්ධයෙන් විවිධාකාරයේ සමාජ සම්මතයන් ලෝකය පුරා පැවතියත්, මෙම ප්‍රජාවට බලපාන ගැටලුකාරී තත්ත්ව විසඳීමට සහ වෙනස්කොට සලකන ප්‍රතිපත්ති සහ නීති වෙනස් කිරීමට බොහෝ රටවල් වෙනස්කම් අරමුණු කොටගත් ගමනක් ආරම්භ කර ඇත. විශේෂයෙන්ම දකුණු ආසියානු කලාපය ගත් කළ, යටත්විජිත සමයේ හඳුන්වාදුන්, ඓතිහාසිකවම මෙම ප්‍රජාව ආන්තිකකරණයට ලක්කළ නීති වෙනස් කිරීමට ඉන්දියාව සහ නේපාලය වැනි රටවල් ක්‍රියාකාරී ලෙස පියවර ගෙන ඇත. සමරිසි විවාහ නීතිගත කළ ප්‍රථම එක්සත් ජාතීන්ගේ සාමාජික ආසියානු රට, ප්‍රථම දකුණු ආසියානු රට, සහ ලෝකයේ ප්‍රථම ඌන සංවර්ධිත රට වන්නේ නේපාලයයි.[1] LGBTIQ+ ප්‍රජාවේ අයිතීන් සම්බන්ධයෙන් කලාපය තුළ සිදුවන එවැනි වැදගත් සිදුවීම් තුළින් ඔවුන්ගේ සිවිල් සහ දේශපාලන අයිතීන් සම්බන්ධයෙන් දැනට පවතින තත්වය පිළිබඳව ප්‍රජාවේ මතය අවබෝධ කරගැනීමේ වැදගත්කම පෙන්වයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය හරහා පුරවැසියන්ට ලබාදී ඇති ආරක්ෂාව නොසලකා LGBTIQ+ පුද්ගලයින්ට එරෙහිව සිදුවන වධහිංසා, කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකීමෙන් නිදහස් වීමේ අයිතිය උල්ලංඝනය කෙරෙන අවස්ථා බොහොමයක් ඇති අතර, එම අමානුෂික ක්‍රියා දිගින් දිගටම සිදුවෙමින් පවතී. තවද, මෙවැනි ක්‍රියා මගින් ශ්‍රී ලංකාව අනුමත කර ඇති වධහිංසාවට සහ අනෙකුත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම්වලට එරෙහි 1984 සම්මුතිය සම්බන්ධ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් ද උල්ලංඝනය වේ.

LGBTIQ+ ප්‍රජාව අපරාධකරුවන් ලෙසින් හංවඩු ගැසීම හරහා ඔවුන්ව වෙනස්කොට සැලකීමට ලක්කරමින්, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය 365 සහ 365 අ වගන්ති හරහා සමරිසි ලිංගික ක්‍රියා අපරාධීකරණය කර ඇත. සොඩොමි නීති අඛණ්ඩව ක්‍රියාත්මක නොවුනත්, ඒවා සමාජ අගතියට දායක වේ. 2022 වසරේ මාර්තු මාසයේදී, කාන්තාවන්ට එරෙහිව වෙනස්කොට සැලකීම තුරන් කිරීම සඳහා වන කමිටුව (CEDAW) ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර කැමැත්තෙන් සිදුවන සමරිසි ලිංගික සබඳතා අපරාධීකරණය කිරීම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර, එවැනි සබඳතා නිර්-අපරාධීකරණය කරන ලෙස රජයට දැඩි ලෙස කියා සිටියේය.[2] ශ්‍රී ලංකාව සඳහා වූ 42 වැනි විශ්ව කාලාන්තර සමාලෝචනය (UPR) අතරතුරදී, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, නෝර්වේ සහ නෙදර්ලන්තය ඇතුළු රටවල් 19ක් කැමැත්තෙන් සිදුවන සමරිසි ලිංගික ක්‍රියා නිර්-අපරාධීකරණය කරන ලෙස නිර්දේශ කරන ලදී.

මීට අමතරව, 'වෙනත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින් වංචා කිරීම' යන වරද සම්බන්ධයෙන් පවතින දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය මෙන්ම 1841 පාදඩ ආඥා පනත යන නීතිමය ප්‍රතිපාදන ද LGBTIQ+ ප්‍රජාවේ සාමාජිකයින්ව අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබාගැනීමට පුළුල් ලෙස භාවිතා කරයි. ඔවුන් අතර, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්, හරස් විලාසිතා කරන ප්‍රජාව, සමාජභාවී සම්මතවලට නොගැලපෙන පෙනුමක් ඇති පුද්ගලයින්, සහ වාණිජ ලෙස ලිංගික වෘත්තියේ යෙදෙන පුද්ගලයින් විශේෂ වේ.[3]

---

[1] Salerno, R. (2024, January 2). *2023 World Same-Sex Marriage and LGBT Rights Progress – Part 3: Asia*. https://76crimes.com/2024/01/02/2023-world-same-sex-marriage-and-lgbt-rights-progress-part-3-asia/

[2] *Sri Lanka: Case before UN Committee on the Elimination of Discrimination against Women (CEDAW) | Human Dignity Trust*. (n.d.). Www.humandignitytrust.org. https://www.humandignitytrust.org/what-we-do/cases/sri-lanka-case-before-un-committee-on-the-elimination-of-discrimination-against-women-cedaw/

[3] *Sri Lanka's Vagrants Ordinance No. 4 of 1841: A Colonial Relic Long Overdue for Repeal A Briefing Paper*. (2021). https://www.icj.org/wp-content/uploads/2022/01/Sri-Lanka-Briefing-Paper-A-Colonial-Relic-Long-Overdue-for-Repeal-2021-ENG.pdf

සංස්කෘතික හා සමාජ අපකීර්තිය හේතුවෙන් වඩාත් නරක අතට හැරී ඇති මෙම වෙනස්කොට සලකන නීති ශ්‍රී ලංකාවේ **LGBTIQ+** ප්‍රජාව විවිධ ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට, කොන්කිරීම් වලට සහ ප්‍රචණ්ඩත්වයට ලක් කරයි. **2020** වසරේ ඔක්තෝම්බර් මාසයේදී **EQUAL GROUND** සහ **Human Rights Watch** සංවිධාන විසින් නිකුත් කරන ලද වාර්තාවකින් හෙළි වූයේ[4], **2007** සිට සමරිසි ලිංගික ක්‍රියා (සිදු වූ බව) ඔප්පු කිරීම සඳහා අවම වශයෙන් පුද්ගලයින් හත් දෙනෙකු ගුද මාර්ග සහ යෝනි මාර්ග පරීක්ෂා කිරීම් ඇතුළු බලහත්කාර ශාරීරික පරීක්ෂණවලට ලක්කර ඇති බවයි. විශේෂයෙන්ම සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සහ විවිධ සමාජභාවී අනන්‍යතා ඇති පුද්ගලයින් ඉලක්ක කරගෙන සිදුවන පරිවර්තන චිකිත්සාව ද වාර්තා වේ.

නැවත නැවත මතුවන අභියෝග ඇති නමුත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සහ ශ්‍රී ලංකා පොලීසිය වැනි විවිධ ආයතන සහ මහජනතාව විසින් ගොනු කළ පෙත්සම් ගණනාවක් හරහා ප්‍රජාව වඩාත් පිළිගන්නා නීතිමය වෙනස්කම් ඇතිකිරීමට සහ **LGBTIQ+** ප්‍රජාව කෙරෙහි මානුෂීය සැලකීම් තහවුරු කිරීමට ඇති අවශ්‍යතාව සපුරාලීමට විවිධ ප්‍රයත්න සහ මැදිහත්වීම් සිදුකර ඇත.

2022 වසරේ අගෝස්තු මස, සමරිසි සබඳතා නිර්-අපරාධීකරණය කිරීම මෙන්ම දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය සංශෝධනය කිරීම හා 365ආ වගන්තිය ඉවත් කිරීම[5] අරමුණු කොටගෙන ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂයක් විසින් පුද්ගලික පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පත නීතිමය අභියෝගවලට මුහුණ දුන්නද, **2023** වසරේ මැයි මාසයේදී ලැබුණු ශ්‍රේෂ්ඨාධිකරණ අනුමැතිය එහි ව්‍යවස්ථානුකූලභාවය තහවුරු කළේ රටේ නීතිමය ක්ෂේත්‍රයෙහි ඉතා වැදගත් සිදුවීමක් සනිටුහන් කරමිනි.[6] ශ්‍රී ලංකා මනෝ චිකිත්සකවරුන්ගෙ සංගමය විවිධ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානතීන් මානසික රෝග ඇති කරයි යන මතයට විරුද්ධ වී ඇති අතර, කැමැත්තෙන් සිදුවන සමරිසි ලිංගික හැසිරීම් නිර්-අපරාධීකරණය කරන ලෙසත් **LGBTIQ+** ප්‍රජාවට සහය දැක්වීම සඳහා ආරක්ෂිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලෙසත් රජයෙන් ඉල්ලා ඇත.

මෙවැනි පසුබිමක, **Équité Sri Lanka** සංවිධානය සමාජ විද්‍යාඥයින්ගේ සංගමය (**SSA**) සම්බන්ධ කර ගත්තේ ආනුභවික සාක්ෂි සමගින් ඔවුන් සිදුකරමින් පවතින අධිවාචන කටයුතු ශක්තිමත් කිරීම සඳහා ක්‍රමානුකූල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීමටයි. **Westminster Foundation for Democracy** වෙනුවෙන් **2020** වසරේදී **SSA** විසින් සිදුකළ මහජන මත දැනගැනීමේ සමීක්ෂණයක් තවදුරටත් පුළුල් කරමින්, **LGBTIQ+** ප්‍රජාව සමග එක්ව සමස්ත රට ආවරණය කරමින් සමීක්ෂණයක් සිදු කිරීමට **Équité Sri Lanka** සංවිධානය **SSA** වෙත පැවරීය. මෙය මේ තරම් පුළුල් මට්ටමින් ශ්‍රී ලංකාව තුල සිදුවන ප්‍රථම අවස්ථාව වන අතර ප්‍රජාවට වඩාත් අදාළ වන කාරණා සම්බන්ධයෙන් ඔවුන්ගේ මත ඇගයීම මෙම සමීක්ෂණයේ අරමුණුයි. එය, දේශපාලන සහභාගීත්වය, යුක්තිය සඳහා ප්‍රවේශ වීම, රජයේ ආයතන සමඟ ගනුදෙනු කිරීම, අධ්‍යාපනය, නිවාස සඳහා ප්‍රවේශය, සහ සෞඛ්‍ය සේවා ලබාගැනීමට ඇති හැකියාව ඇතුළු ඔවුන්ගේ අත්දැකීම්වල විවිධ පැතිකඩයන් ගවේෂණය කරයි. **Équité Sri Lanka** සංවිධානය විසින් සිදුකරන අනාගත වැඩසටහන් හරහා පුළුල් ප්‍රතිපත්ති මට්ටමේ වෙනස්කම් ධෛර්යමත් කිරීමේ අරමුණ ඇතිව **LGBTIQ+** ප්‍රජාවගේ හඬ සහ අදහස් ග්‍රහණය කරගැනීම මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණයි. විශේෂඥ කමිටුවක් සමඟ මීට අදාළ රැස්වීම් පැවැත්වූ අතර, අධ්‍යයනය සැලසුම් කිරීමේ අදියරේදී සහ මෙම වාර්තාව සැකසීමේදී උපදෙස් ලබාගන්නා ලදී.

---

[4] *Sri Lanka: Forced Anal Exams in Homosexuality Prosecutions*. (2020, October 20). Human Rights Watch. https://www.hrw.org/news/2020/10/20/sri-lanka-forced-anal-exams-homosexuality-prosecutions

[5] *Dantanarayana, R. (2023, August 23). A ray of hope: proposed decriminalisation of LGBTQI+ rights in Sri Lanka. Www.ibanet.org.* https://www.ibanet.org/sri-lanka-proposed-decriminalisation-lgbtqi-rights#_edn22

[6] Reuters. (2023, May 10). *Sri Lanka Supreme Court clears path to decriminalize homosexuality*. CNN. https://edition.cnn.com/2023/05/09/asia/sri-lanka-decriminalize-homosexuality-supreme-court-intl-hnk/index.html

මෙම වාර්තාව පහත දක්වා ඇති අයුරින් සංවිධානය කර ඇත: පළමුවැනි පරිඡේදය මෙම අධ්‍යයනයට සහභාගී වූ **LGBTIQ+** ප්‍රජාවේ ජනවිකාශනය ඇතුළු ප්‍රතිචාර දක්වන්නන්ගේ පුද්ගල විස්තර පිලිබඳ වැටහීමක් ලබා දේ. සොයාගැනීම් පිලිබඳ සාකච්ඡා කිරීමට පෙර මෙම වාර්තාවට දායකත්වය සැපයූ කණ්ඩායම පිළිබඳව පාඨකයින්ට වඩාත් හොඳ අවබෝධයක් ලබාදීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. **LGBTIQ+** ප්‍රජාවේ ප්‍රතිචාර දක්වන්නන් නියැලී සිටින රැකියා වර්ග පිළිබඳ අධ්‍යයනය කිරීම දෙවැනි පරිච්ඡේදයේ අරමුණයි – ඔවුන් තමන්ගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් මුහුණපාන ගැටලු මෙම පරිච්ඡේදය තුළ තවදුරත් සොයා බලයි. විවිධාකාරයේ දේශපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන්නන් පෙන්වා ඇති ක්‍රියාකාරීත්ව මට්ටම විශ්ලේෂණය කරමින් තුන්වැනි පරිච්ඡේදය තුළින් ඔවුන්ගේ දේශපාලනික සහභාගීත්වය කෙරෙහි අවධානය යොමු කරන අතර, ප්‍රතිඵලදායක සහ ක්‍රියාකාරී දේශපාලනික සහභාගීත්වයට ඇති බාධා හඳුනාගනී. අධිකරණ සේවා ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන්නන්ගේ අත්දැකීම ඇතුළුව එම සේවාවලට ඇති ප්‍රවේශය පිළිබඳව සිව්වැනි පරිච්ඡේදය අවධානය යොමු කරයි. පස්වැනි පරිච්ඡේදය හරහා ප්‍රතිචාර දක්වන්නන්ගේ අධ්‍යාපනික අත්දැකීම් මතු කරන අතර, ඔවුන් පාසල් කාලය තුළ මුහුණදුන් බාධක මෙන්ම ඔවුන් ලබා ඇති අධ්‍යාපන මට්ටම ද පෙන්වා දෙයි. සයවැනි පරිච්ඡේදය ජීවන තත්වයන්, ඔවුන්ට පොදු අවකාශයන්ට ඇතුළුවීමට ඇති හැකියාව, සහ මෙම අවකාශයන්ට ප්‍රවේශ වීමේ අභියෝග සොයා බලයි. අවසාන පරිච්ඡේදය වන හත්වැනි පරිච්ඡේදය ප්‍රතිචාර දක්වන්නන් ඔවුන්ගේ ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය හා සම්බන්ධ සහ සාමාන්‍ය සෞඛ්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා අදාළ සෞඛ්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේදී මුහුණදෙන කරුණු කිහිපයක් පෙන්වා දේ.

## ක්‍රමවේදය

**LGBT ප්‍රජාවෙන් නියැදි ප්‍රතිචාර දක්වන්නන් 856 දෙනෙක් සමග අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. විවිධ වූ සමාජභාවී අනන්‍යතා, ප්‍රකාශන සහ ලිංගික දිශානතීන් වල ඇති වෙනස්වන සුලු බව සහ ඒවා හඳුනාගැනීමේ අභියෝග සැලකිල්ලට ගනිමින්, අධ්‍යයනය තුළින් අවධානය යොමු කළේ තමන් ස්ථිතික සමාජභාවිය සමරිසි පුරුෂ, සමරිසි ස්ත්‍රී හෝ ද්විරිසි ලෙස හඳුනාගත් අය සහ සංක්‍රාන්ති සමාජභාවිය විෂම ලිංගික, සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ හෝ ද්විරිසි ලෙස හඳුනාගත් අය පමණි.**

හේතු කිහිපයක් මත පදනම්ව - එනම්, **(i) LGBT** ප්‍රජාවේ ප්‍රතිචාර දක්වන්නන්ට ළඟාවීම සහ හඳුනාගැනීම සම්බන්ධ අභියෝග සහ සීමාවන් ගණනාවක් තිබීම සහ **(ii)** ප්‍රතිචාර දක්වන්නන්ගේ ආරක්ෂාවට, සංවේදීතාවට, සහ විශ්වාසයට/රහස්‍යභාවයට ප්‍රමුඛත්වය දෙන ආකාරයේ ආචාරධර්ම මත පදනම් වූ පර්යේෂණ ක්‍රමවේද පවත්වා ගැනීම සඳහා - සමාජ විද්‍යාඥයින්ගේ **(SSA)** සංගමය විසින් හිමබෝල නියැදි ක්‍රමවේදය භාවිතා කරන ලදී.

***<u>නියැදි ප්‍රතිචාර දක්වන්නන් රැස්කර ගැනීම</u>***

ප්‍රතිචාර දක්වන්නන් රැස්කර ගත්තේ පහත ආකාරයටයි:

a) **LGBT** ප්‍රජාව පුරා විහිදී ඇති **ÉQUITÉ Sri Lanka**හි ප්‍රාදේශීය ජාලයේ සහයද ඇතිව, මෙම අධ්‍යනය සඳහා **SSA** විසින් සිංහල තොරතුරු රැස් කරන්නන් 21 දෙනෙකු සහ දමිළ තොරතුරු රැස් කරන්නන් 3 දෙනෙකු බඳවා ගන්නා ලදී.[7] ප්‍රතිචාර දක්වන්නන් රැස්කර ගත්තේ මෙම තොරතුරු රැස් කරන්නන් හරහා වන අතර, මෙහිදී ඔවුන්ගේ පෞද්ගලික හැඳුනුම්කම්/ජාලයන් විශේෂ විය.[8]

b) සමීක්ෂණ ප්‍රශ්නාවලිය මාර්ගගත ක්‍රමයට **ÉQUITÉ Sri Lanka** සහ **SSA** සමග සම්බන්ධ **LGBT** ප්‍රජාව සමග කටයුතු කරන දේශීය සංවිධාන/පුද්ගලයින් ජාලය සමග බෙදාගන්නා ලදී.

*c)* **ÉQUITÉ Sri Lanka** හි සහයෝගයද ඇතිව **LGBT** ප්‍රජාව සමග කටයුතු කරන සංවිධාන සම්මුඛ සාකච්ඡා, තනිව සම්පූර්ණ කරන ප්‍රශ්නාවලි, හෝ දුරකථනය හරහා කරන සාකච්ඡා ආදී ක්‍රමවලින් සමීක්ෂණය සමග සම්බන්ධ වීමට ප්‍රතිචාර දක්වන්නන් හඳුන්වා දෙන ලදී.

***<u>සමීක්ෂණ ප්‍රශ්නාවලිය</u>***

සමීක්ෂණ ප්‍රශ්නාවලිය හරහා දේශපාලන සහභාගීත්වය, රැකියා, අධ්‍යාපනය, අධිකරණ පද්ධති සහ නීතියේ ආධිපත්‍යය, රාජ්‍ය ආයතන හා ක්‍රියාවලීන් සමඟ සම්බන්ධ වීම, පදිංචිය, සහ සෞඛ්‍ය යන කරුණු සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන්නන්ගේ මතය විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයේ ස්වභාවයට අනුව සමාජභාවී අනන්‍යතාවයට විශේෂිත වූ ප්‍රශ්න කිහිපයක්ද තිබිණ.[9] සමීක්ෂණ ප්‍රශ්නාවලිය ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් සම්පූර්ණ කරන ලදී. ප්‍රතිචාර දක්වන්නන්ගේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය සැලකිල්ලට ගනිමින්, සමීක්ෂණ ප්‍රශ්නාවලිය තනිව සම්පූර්ණ කිරීමේ අවස්ථාව ඔවුන්ට ලබා දෙන ලදී. තාක්ෂණික සහය ඉල්ලා සිටි අයට ඔවුන්ට අවශ්‍ය වූ සහය

[7] ගණන් ගන්නන් විශාල සංඛ්‍යාවක් රැස්කිරීම SSA ට අතිශයින්ම අභියෝගාත්මක කර්තව්‍යක් වූ අතර, මෙහිදී, දෙමළ කතා කරන ගණන් ගන්නන් රැස්කිරීම විශේෂ වේ.

[8] ගණන් ගන්නන් පැමිණියේ කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, නුවරඑළිය, ගාල්ල, මාතර, යාපනය, වව්නියාව, කුරුණෑගල, පුත්තලම, රත්නපුර, අනුරාධපුරය සහ කෑගල්ල යන ප්‍රදේශවලිනි.

[9] තමන් තෝරාගත් සමාජභාවී අනන්‍යතාවය පිළිබිඹු කරන සමාජභාවය හඳුනාගැනීමේ සහතිකයක්, උප්පැන්න සහතිකයක්, ජාතික හැඳුනුම්පතක් හෝ විදේශ ගමන් බලපත්‍රයක් වැනි නිල ලේඛනයක් තමන් සතුව ඇත්දැයි සඳහන් කරන ලෙස සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට දැනුම් දෙන ලදී. තවද, හෝමෝන පෙති ආදී බෙහෙත් ලබා ගැනීමට, ලිංගික සංක්‍රාන්ති සැත්කම් කරගැනීමට, සහ සංක්‍රාන්තියට උදව් වන අනෙකුත් ක්‍රියාවලීන් සිදුකර ගැනීමට සහ ඊට අදාළ වියදම් දරාගැනීමට හැකිදැයි සඳහන් කරන ලෙස ද සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව නියෝජනය කරන පුද්ගලයින්ට දැනුම් දෙන ලදී.

ලබා දෙන ලදී. අන්තර්ජාලය ඔස්සේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ අවස්ථාවක (සූම් හරහා) අදාළ තොරතුරු රැස් කරන්නන් සමඟ පර්යේෂණ කණ්ඩායම ද ඊට සහභාගී විය.[10]

***<u>සමීක්ෂණ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම</u>***

ක්ෂේත්‍ර කටයුතුවල නියැලීමට පෙර, මෙම අධ්‍යයනය, සමීක්ෂණ පර්යේෂණ මෙවලම්, ක්ෂේත්‍ර තාක්ෂණික ක්‍රම, සහ දත්ත රැස්කිරීම සඳහා භාවිතා කරන මාර්ගගත මෘදුකාංගය පිළිබඳ පුළුල් පුහුණුවක් තොරතුරු රැස් කරන්නන් හට ලබා දෙන ලදී. ප්‍රාදේශීය සංවිධාන විසින් ස්ථානීය දත්ත රැස්කිරීමේ සැසි සංවිධානය කළ අවස්ථාවක, **SSA** හි පර්යේෂකයන් සහ **ÉQUITÉ Sri Lanka** කාර්ය මණ්ඩලය ප්‍රතිචාර දක්වන්නන් සමග සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට හා සමීක්ෂණ ප්‍රශ්නාවලිය සම්පූර්ණ ඔවුන්ට අවශ්‍ය වූ තාක්ෂණික සහාය ලබාදීමට කටයුතු කරන ලදී.

***<u>පර්යේෂණ අධ්‍යයනය අතරතුරදී මුහුණ පෑ අභියෝග සහ අධ්‍යයන සීමාවන්</u>***

විවිධාකාරයේ සමාජ අපකීර්ති, සම්මතයන්, සංස්කෘතික සංවේදීතාවන් සහ **LGBT** ප්‍රජාවගේ සීමා වී ඇති පිළිගැනීම හේතුවෙන් අධ්‍යයනය සඳහා මුලින් බලාපොරොත්තු වූ ප්‍රතිචාර දක්වන්නන් නියැදි ප්‍රමාණය එක්රැස් කරගැනීම අභියෝගාත්මක වූ අතර, මෙම තත්වය විශේෂයෙන් දෙමළ සහ මුස්ලිම් ප්‍රතිචාර දක්වන්නන් අතර දක්නට හැකි විය.[11] මෙහි ප්‍රතිඵලය වූයේ, **(i)** අපේක්ෂිත කාලසීමාවන් තුළ ක්ෂේත්‍ර කටයුතු අවසන්කිරීමේ ප්‍රමාදයන්, **(ii) LGBT** ප්‍රජාව විද්‍යාත්මකව නියෝජනය වන ආකාරයේ නියැදියක් ලබාගැනීම සම්බන්ධ සීමාවන්, සහ **(iii)** තාක්ෂණයට සීමිත ප්‍රවේශයක් ඇති පිරිස් සඳහා දත්ත රැස්කිරීමේ විකල්ප ක්‍රම අනුගමනය කිරීමට සිදුවීම (ඒ සඳහා **SSA** විසින් ස්ථානීය හමුවන් සිදු කළ අතර, සමීක්ෂණ ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී අන්තර්ජාලයට පිවිසීම, ඩිජිටල් උපකරණ, සහ තාක්ෂණික සහාය සම්බන්ධ සහාය ලබා දුන්නේය.)[12]

හිමබෝල නියැදි ක්‍රමවේදයක් භාවිතා කළ නිසා සහ ප්‍රතිචාර දක්වන්නන් අහඹු ලෙස තෝරා නොගත් නිසා, නියැදිය පක්ෂග්‍රාහී වීමේ සම්භාවිතාවක් පවතින අතර ඇතැම් කණ්ඩායම් වැඩිපුර නියෝජනය වීම හෝ අඩුවෙන් නියෝජනය වීම සිදුවිය හැකිය. තවද, අහඹු නොවන නියැදි තේරීම සලකා බැලීමේදී, සමස්ත **LGBT** ප්‍රජාව සම්බන්ධයෙන් මෙම සොයාගැනීම් සාමාන්‍යකරණය කිරීම අභියෝගාත්මක විය හැකිය.

[10] ප්‍රතිචාර දක්වන්නන්ට සූම් මෘදුකාංගය භාවිතා කිරීමට හැකියාවක් නොතිබූ අවස්ථාවක සම්මුඛ සාකච්ඡා පැවැත්වූයේ වට්ස්ඇප් යෙදුමේ කණ්ඩායම් ඇමතුම් හරහා යි. එහිදී, අවශ්‍ය ඕනෑම තාක්ෂණික සහයක් ලබාදීම සඳහා ÉQUITÉ Sri Lanka සහ SSA ආයතනවල පරීක්ෂකයින් සහ කාර්ය මණ්ඩලය සූදානම්ව සිටියහ.

[11] අධ්‍යනයට සඳහා මුලින්ම සැලසුම් කළ නියැදි ප්‍රමාණය වන්නේ, LGBTIQ+ ප්‍රජාව නියෝජනය කරන ප්‍රතිචාර දක්වන්නන් 1,000 කි.

[12] ප්‍රතිචාර දක්වන්නන් මුහුණ පෑ සම්බන්ධ වීමේ/සන්නිවේදනය කිරීමේ ගැටළු හේතුවෙන් අධ්‍යනය අභියෝග ගණනාවකට මුහුණ පෑ අතර, සූම් හරහා සම්බන්ධ වීම අපහසු වූ පිරිස් සමග දුරකථන මාර්ගය වැනි විකල්ප ක්‍රම මගින් සාකච්ඡා පවත්වන ලදී.

# පළමුවැනි පරිච්ඡේදය: ප්‍රතිචාර දක්වන්නන්ගේ පුද්ගල විස්තර

*මෙම පරිච්ඡේදය තුළින් සමීක්ෂණයට සහභාගී වූ ප්‍රතිචාර දක්වන්නන්ගේ දළ විශ්ලේෂණයක් සපයන අතර, ඔවුන් හඳුනාගන්නා සමාජභාවී අනන්‍යතාවයන් සහ ලිංගික දිශානතීන් ඉස්මතු කරයි.*[13]

## සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය

**සමීක්ෂණයට සහභාගී වූ ප්‍රතිචාර දක්වන්නන්ගේ සමස්ත නියැදියෙන්, 65% කට ආසන්න ප්‍රමාණයක් තමන් ස්ථිතික සමාජභාවිය පුද්ගලයින් ලෙස හඳුනාගත් අතර, 32% කට ආසන්න ප්‍රමාණයක් සංක්‍රාන්ති සමාජභාවිය පුද්ගලයින් ලෙස ඔවුන්ව හඳුනාගන්නා ලදී. නියැදි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 2%ක් පමණ තමන් සංක්‍රාන්ති සමාජභාවී නොවන හෝ සංක්‍රාන්ති සමාජභාවී ලෙස හඳුනාගත්තේ නැත.**[14] [කරුණාකර පහත ඇති සටහන 1 බලන්න]

සටහන 1: ප්‍රතිචාර දක්වන්නන්ගේ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තොරතුරු




**සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සම්බන්ධයෙන් ගත් කල, සමීක්ෂණයට සහභාගී වූ පුද්ගලයින් 270 දෙනෙකුගෙන් නියැදි ප්‍රතිචාර දක්වන්නන් 221 දෙනෙකු ඔවුන් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි හෝ ගැහැණු බව පවසා ඇත. ඔවුන් අතරින් 56.1% ක් ඔවුන් සංක්‍රාන්ති සමාජභාවී පිරිමි පුද්ගලයින් බවත්, 43.9% ක් ඔවුන් සංක්‍රාන්ති සමාජභාවී ගැහැණු පුද්ගලයින් බවත් පවසා ඇත. [කරුණාකර පහත ඇති සටහන 2 බලන්න]**[15]

[13] අධ්‍යනය සම්බන්ධ විවිධ වූ සීමා හේතුවෙන්, ප්‍රමාණාත්මක පර්යේෂණය අවධානය යොමු කරන්නේ ප්‍රතිචාර දක්වන්නන්ගේ හඳුනාගත් සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය පිළිබඳව පමණයි. දත්ත විශ්ලේෂණය සහ අධ්‍යන වාර්තාව සඳහා සමාජභාවී ප්‍රකාශනය සැලකිල්ලට ගෙන නැත.

[14] තමන් 'gender fluid' (ස්ථිර සමාජභාවී අනන්‍යතාවක් නැති) හෝ 'non-binary' (ගැහැණු-පිරිමි සමාජභාවී අනන්‍යතා ද්විත්වයට සීමා නොවන) ලෙස හඳුනාගත් ප්‍රතිචාර දක්වන්නන් මීට ඇතුලත් විය.

[15] පුද්ගලයෙකු සංක්‍රාන්ති සමාජභාවී පිරිමි හෝ සංක්‍රාන්ති සමාජභාවී ගැහැණු අයෙකුදැයි අසන ප්‍රශ්නය පිළිතුරු දීම අනිවාර්ය එකක් නොවූ බවත්, මෙහි සඳහන් ප්‍රතිශත ඊට පිළිතුරු දුන් අයගේ පිළිතුරු මත තීරණය වී ඇති බවත්, සඳහන් කළ යුතුය. එමෙන්ම, මෙම දත්තවල වෙන් වෙන් ලෙස සඳහන් කළ සමස්ත ප්‍රතිශතය, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ සමස්ත නියැදි ප්‍රමාණය සමග නොගැලපීමට ඉඩ ඇත.

**සටහන 2: සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන්ගේ සමාජභාවී අනන්‍යතාවය පිළිබඳ තොරතුරු**




සමීක්ෂණයට සහභාගී වූ ප්‍රතිචාර දක්වන්නන්ගේ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය විශ්ලේෂණය කිරීමේදී, ඔවුන්ගෙන් 17.3% ක් පමණ ස්ථිතික සමාජභාවිය සමරිසි ගැහැණු පුද්ගලයින් බවත්, 50.4% ක් පමණ ස්ථිතික සමාජභාවිය සමරිසි පිරිමි බවත්, 32.4% ක් ස්ථිතික සමාජභාවිය ද්විරිසි පිරිමි හෝ ගැහැණු බවත් පවසන ලදී. [කරුණාකර පහත ඇති සටහන 3 බලන්න]

**සටහන 1: ස්ථිතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය පිළිබඳ තොරතුරු**




තමන් සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට අයත් බව පැවසූ පිරිසෙන් 10.7% ක් පමණ තමන් සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු බවත්, 21.5% ක් තමන් සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි බවත්, 7.8% ක් තමන් සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි පිරිමි හෝ ගැහැණු බවත්, අසන්න වශයෙන් 60% ක් පමණ තමන් සංක්‍රාන්ති සමාජභාවී-විෂමරිසි බවත් පැවසීය. තමන් සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට අයත් බව පැවසූ අයගෙන් ආසන්න වශයෙන් 8.1% කට "වෙනත්" යනුවෙන් වර්ගීකරණය කළ ලිංගික දිශානති තිබිණ.[16] [කරුණාකර පහත ඇති සටහන 4 බලන්න]

[16] තමන්ව, 'pansexual' (ඕනෑම සමාජභාවී අනන්‍යතාවක් ඇති පුද්ගලයෙකුට කායිකව හෝ මානසිකව ආකර්ෂණය වන), 'demisexual' (පුද්ගලයෙකු සමග මානසික බැඳීමක් ගොඩනගාගැනීමෙන් පසුව පමණක් ඔවුන් කෙරෙහි ලිංගික ආකර්ෂණයක් දැනෙන) සහ 'queer' (LGBTIQ+ ප්‍රජාවට/පුද්ගලයින්ට අපහාසාත්මක ලෙස ඇමතීමට අතීතයේදී භාවිත කළ නමුත් වර්තමානයේදී ඇතැම් LGBTIQ+ පුද්ගලයින් තමන්ව හඳුන්වාගැනීමට භාවිත කරන පදයක්) යනුවෙන් හඳුන්වාගත් ප්‍රතිචාර දක්වන්නන් මීට ඇතුලත් විය.

සටහන 2: සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන්ගේ ලිංගික දිශානතිය පිළිබඳ තොරතුරු




## වයස

ප්‍රතිචාර දක්වන්නන්ගේ ස්ථිතික සමාජභාවිය සමරිසි ගැහැණු නියැදියේ තොරතුරු අනුව, තරමක් වැඩි ප්‍රතිශතයක් වයස අවුරුදු **40-49** කාණ්ඩයේ විය. ප්‍රතිචාර දක්වන්නන්ගේ ස්ථිතික සමාජභාවිය සමරිසි පිරිමි නියැදිය සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් වයස අවුරුදු **18-29** සහ **30-39** කාණ්ඩවලට අයත් විය. ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ස්ථිතික සමාජභාවිය -ද්විරිසි (පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයම) නියැදියට අනුව, සමීක්ෂණයට සහභාගී වූ බහුතරයක් දෙනා වයස අවුරුදු **18-29** කාණ්ඩය තුළ විය. [කරුණාකර පහත ඇති වගුව 1 බලන්න]

වගුව **1**: ස්ථිතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන්ගේ වයස පිළිබඳ තොරතුරු

| | අවුරුදු 18-29 | අවුරුදු 30-39 | අවුරුදු 40-49 | අවුරුදු 50-59 | අවුරුදු 60 ට වැඩි |
|---|---|---|---|---|---|
| සමරිසි ගැහැණු | 15.5% | 15.8% | 24.6% | 22.0% | 25.0% |
| සමරිසි පිරිමි | 49.2% | 54.9% | 44.3% | 46.3% | 68.8% |
| ද්විරිසි පිරිමි හෝ ද්විරිසි ගැහැණු | 35.3% | 29.3% | 31.1% | 31.7% | 6.3% |
| දත්ත පදනම | 317 | 133 | 61 | 41 | 16 |

සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු පිරිස සම්බන්ධයෙන් ගත් කළ, සමීක්ෂණයට වැඩියෙන්ම සහභාගී වී තිබුණේ අවුරුදු 18-29 සහ 50-59 කාණ්ඩවල පුද්ගලයිනුයි. සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි ලෙස තමන්ව හඳුන්වාගත් පිරිසෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් ඔවුන් අවුරුදු 40-49 වයස් කාණ්ඩයේ බව සඳහන් කළ අතර, සැලකිය යුතු පිරිසක් අවුරුදු 30-39 සහ 50-59 කාණ්ඩවල ද සිටියෝය. සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි (පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයම) පිරිසෙන් බහුතරයක් දෙනා අවුරුදු 50-59 වයස් කාණ්ඩයට අයත් බව පෙනී යයි. තමන්ව සංක්‍රාන්ති සමාජභාවී-විෂමරිසි ලෙස හඳුන්වාගත් පිරිසෙන් බහුතරයක් දෙනා අවුරුදු 18-29 සහ 30-39 කාණ්ඩවලට අයත් වන බව පෙනී යයි. [කරුණාකර පහත ඇති වගුව 2 බලන්න]

වගුව 2: සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන්ගේ වයස පිළිබඳ තොරතුරු

| | 18-29 | 30-39 | 40-49 | 50-59 | 60+ |
|---|---|---|---|---|---|
| සමරිසි ගැහැණු | 12.9% | 4.0% | 11.1% | 12.5% | 0.0% |
| සමරිසි පිරිමි | 13.5% | 22.0% | 47.2% | 25.0% | 83.3% |
| ද්විරිසි පිරිමි හෝ ද්විරිසි ගැහැණු | 6.5% | 12.0% | 5.6% | 25.0% | 0.0% |
| විෂමරිසි | 57.6% | 52.0% | 33.3% | 37.5% | 16.7% |
| වෙනත් | 9.4% | 10.0% | 2.8% | 0.0% | 0.0% |
| දත්ත පදනම | 170 | 50 | 36 | 8 | 6 |

## ජාතිය

සමීක්ෂණයට සහභාගී වූ ප්‍රතිචාර දක්වන්නන්ගේ නියැදිය අනුව, ඔවුන්ගෙන් බහුතරයක් සිංහල ප්‍රජාවට අයත් විය. [කරුණාකර පහත ඇති වගු 3 සහ 4 බලන්න]

වගුව 3: ස්ථිතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන්ගේ ජාතිය පිළිබඳ තොරතුරු

| ජාතිය (ස්ථිතික සමාජභාවිය) | % |
|---|---|
| සිංහල | 85.9 |
| දෙමළ | 9.0 |
| උඩරට දෙමළ | 0.9 |
| මුස්ලිම් | 3.5 |
| බර්ගර් | 0.7 |
| දත්ත පදනම | 568 |

වගුව 4: සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන්ගේ ජාතිය පිළිබඳ තොරතුරු

| ජාතිය (සංක්‍රාන්ති සමාජභාවී) | % |
|---|---|
| සිංහල | 87.0 |
| දෙමළ | 7.0 |
| උඩරට දෙමළ | 1.1 |
| මුස්ලිම් | 3.3 |
| බර්ගර් | 1.5 |
| දත්ත පදනම | 270 |

# දෙවැනි පරිච්ඡේදය : රැකියා සම්බන්ධ අත්දැකීම්

***LGBT** ප්‍රජාව තුළ සිටින සංක්‍රාන්ති සමාජභාවී නොවන සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට අදාළ රැකියා රටා සහ රැකියා සම්බන්ධ අභියෝග පිළිබඳ පහත කොටසින් අවබෝධය ලබාදෙයි. වත්මන් රැකියා තත්වය, රැකියා ලබාගැනීමේදී ඇති වන බාධා, ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය පිලිබඳ පවතින මතයන් රැකියා ලබාගැනීමට සහ වැටුප් සාකච්ඡා කිරීමට බාධාවක් වීම, සහ වර්තමානයේ නියැලී සිටින රැකියාව අපේක්ෂිත වෘත්තීය සමග ගැලපීම වැනි විවිධ අංශ පිලිබඳ සලකා බලයි.*

සමස්තයක් ලෙස, තමන් ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි ගැහැණු, ස්ත්‍රීතික සමාජභාවිය ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි පිරිමි හෝස්ත්‍රීතික සමාජභාවිය ද්විරිසි පිරිමි හෝ ගැහැණු බව පැවසූ පිරිසෙන් තුනෙන් එකක් පමණ (36.6%) බව විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන රැකියාවක නියුතු බව කියා සිටියෝය. ආසන්න වශයෙන් 30% පමණ සිසුන් හෝ රැකියා විරහිත පුද්ගලයින් වේ. [කරුණාකර පහත ඇති වගුව 5 බලන්න]

ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි ගැහැණු ප්‍රතිචාර දක්වන්නන්ගේ නියැදියෙන් බොහෝ දෙනා (30.6%) විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන රැකියාවක නියුතු බව ප්‍රකාශ කරන ලද අතර, ඊට අසන්නම ස්ථානයේ වූයේ අර්ධ කාලීන රැකියාවක නියැලෙන බව කියන පිරිසයි (**17.3%**). ස්ත්‍රීතික සමාජභාවිය සමරිසි පිරිමි ප්‍රතිචාර දක්වන්නන් සම්බන්ධයෙන් ගත් කල, ආසන්න වශයෙන් **40%** ක පිරිසක් විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන රැකියාවක නිරත වූ බව ප්‍රකාශ කළ අතර, **15%** ක් තමන් සිසුන් යැයි පැවසුවෝය. ස්ත්‍රීතික සමාජභාවිය ද්විරිසි පිරිමි සහ ගැහැණු පිරිස සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගෙන් 35.3% ක් පමණ ඔවුන් විධිමත් පූර්ණ කාලීන රැකියාවක නියුතු බව පැවසූ අතර, නියැදියෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (21.7%) සිසුන් විය. [කරුණාකර පහත ඇති වගුව 5 බලන්න]

වගුව 5: ස්ත්‍රීතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන්ගේ වර්තමාන රැකියාව

| | **සමස්ත ස්ත්‍රීතික සමාජභාවිය** | **සමරිසි ගැහැණු** | **සමරිසි පිරිමි** | **ද්විරිසි පිරිමි හෝ ද්විරිසි ගැහැණු** |
|---|---|---|---|---|
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන** | 36.6 | 30.6% | 39.5% | 35.3% |
| **අර්ධ කාලීන** | 13.9 | 17.3% | 12.6% | 14.1% |
| **අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 7.2 | 7.1% | 8.0% | 6.0% |
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන සහ අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 4.4 | 5.1% | 4.5% | 3.8% |
| **ස්වයංරැකියා** | 7.6 | 8.2% | 7.7% | 7.1% |
| **ගෘහස්ත මට්ටමින් සිදුවන මුදල් ඉපයීමේ කටයුතුවලට සහය දීම** | 2.1 | 5.1% | 0.7% | 2.7% |
| **ශිෂ්‍ය** | 16.9 | 13.3% | 15.0% | 21.7% |
| **රැකියා විරහිත** | 11.3 | 13.3% | 11.9% | 9.2% |
| **දත්ත පදනම** | 568 | 98 | 286 | 184 |

සමස්තයක් වශයෙන්, සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු, සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි (පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයම) අයගෙන් **26.3%** ක් විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන රැකියාවක නිරත වන බව පවසන අතර, **22%** කට ආසන්න පිරිසක් අර්ධ කාලීන රැකියාවක නිරත වන බව කියා සිටිති. සංසන්දනාත්මකව බැලූ විට, සංක්‍රාන්ති සමාජභාවී නොවන-සමරිසි ගැහැණු, සංක්‍රාන්ති සමාජභාවී නොවන-සමරිසි පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී නොවන-ද්විරිසි පිරිමි සහ

ගැහැණු පිරිසට වඩා සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවෙන් මදක් වැඩි ප්‍රතිශතයක් රැකියා විරහිත (15.2%) හෝ ස්වයං-රැකියාවල නියුතු (13.7%) බව පවසයි. [කරුණාකර පහත ඇති වගුව 6 බලන්න]

සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු වූ ප්‍රතිචාර දක්වන්නන්ගේ නියැදියෙන් බහුතරයක් දෙනා **(24.1%)** විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන රැකියාවක නියුතු බව පැවසූ අතර, සැලකිය යුතු ප්‍රතිශතයක් පැවැසුයේ ඔවුන් රැකියා විරහිතව **(31%)** හෝ ස්වයං-රැකියාවක නියුතුව සිටින **(20.7%)** බවයි. සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි සම්බන්ධයෙන් සලකා බැලීමේදී, ඔවුන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් කියා සිටියේ ඔවුන් අර්ධ කාලීන **(36.2%)** හෝ විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන **(27.6%)** රැකියාවල නියුතුව සිටින බවයි. සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි (පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයම) ප්‍රජාව සම්බන්ධයෙන් ගත් කල, **30%** කට ආසන්න පිරිසක් විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන රැකියාවක නිරත වී ඇති බව ප්‍රකාශ කළ අතර, **25%** කට ආසන්න පිරිසක් ස්වයං-රැකියාවක නිරත වී ඇති බව පවසයි. සංක්‍රාන්ති සමාජභාවී-විෂමරිසි පුද්ගලයින්ගෙන් සමාන ප්‍රතිශතයකට ආසන්න ප්‍රමාණයක් විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන **(25.7%)** සහ අර්ධ කාලීන **(22.1%)** රැකියාවක නිරත වී ඇති බව පවසයි. [කරුණාකර පහත ඇති වගුව 6 බලන්න]

වගුව **6:** සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන්ගේ වර්තමාන රැකියාව

| | **සමස්ත සංක්‍රාන්ති සමාජභාවී** | **සමරිසි ගැහැණු** | **සමරිසි පිරිමි** | **ද්විරිසි පිරිමි හෝ ද්විරිසි ගැහැණු** | **විෂමරිසි** | **වෙනත්** |
|---|---|---|---|---|---|---|
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන** | 26.3 | 24.1% | 27.6% | 28.6% | 25.7% | 27.3% |
| **අර්ධ කාලීන** | 21.5 | 6.9% | 36.2% | 14.3% | 22.1% | 4.5% |
| **අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 6.3 | 0.0% | 6.9% | 0.0% | 7.9% | 9.1% |
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන සහ අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 4.1 | 3.4% | 1.7% | 9.5% | 5.0% | 0.0% |
| **ස්වයංරැකියා** | 13.7 | 20.7% | 6.9% | 23.8% | 14.3% | 9.1% |
| **ගෘහස්ත මට්ටමින් සිදුවන මුදල් ඉපයීමේ කටයුතුවලට සහය දීම** | 0.7 | 0.0% | 1.7% | 0.0% | 0.7% | 0.0% |
| **ශිෂ්‍ය** | 12.2 | 13.8% | 6.9% | 14.3% | 12.1% | 22.7% |
| **රැකියා විරහිත** | 15.2 | 31.0% | 12.1% | 9.5% | 12.1% | 27.3% |
| **දත්ත පදනම** | 270 | 29 | 58 | 21 | 140 | 22 |

වයස අනුව රැකියාවේ ස්වභාවය පිළිබඳ දත්ත පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් වැඩි ප්‍රතිශතයක් අවුරුදු 18-29 කාණ්ඩයේ සිටින තරුණ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව බවත්, තමන් රැකියා විරහිතව හෝ අර්ධ කාලීන රැකියාවක නියැලී සිටින බව ඔවුන් ප්‍රකාශ කරයි. ප්‍රජාවන් දෙකම නියෝජනය කරන තරුණ පිරිස සංසන්දනය කරද්දී සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාවෙන් **15.9%** ක් රැකියා විරහිත යැයි පැවසූ අතර, එයම පැවසූ සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රජාවේ පිරිස **11.3%** ක් විය. ඊට සමානව, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව නියෝජනය කරන වයස අවුරුදු **18-29** කාණ්ඩයේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 14.1% ක් ස්වයං-රැකියාවල නිරතව සිටින බව පැවසූ අතර, එය, සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රතිචාර දක්වන්නන්ට **(5.0%)** වඩා ඉහළ අගයකි. සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව තුළ වයස අවුරුදු **18-29** කාණ්ඩයේ ප්‍රතිචාර දක්වන්නන්ගෙන් අඩු ප්‍රතිශතයක් (24.1%) විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන රැකියාවක නියුතු බව පැවසූ අතර, එය සංක්‍රාන්ති

සමාජභාවී නොවන ප්‍රතිචාර දක්වන්නන් ප්‍රතිශතයට (33.8%) හා සසඳන විට අඩු අගයකි. [කරුණාකර පහත ඇති 7 සහ 8 වගු බලන්න]

වගුව 7: ස්ත්‍රීතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නගේ වර්තමාන රැකියාව, වයස අනුව

| | 18-29 | 30-39 | 40-49 | 50-59 | 60+ |
|---|---|---|---|---|---|
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන** | 33.8% | 47.4% | 34.4% | 36.6% | 12.5% |
| **අර්ධ කාලීන** | 12.0% | 18.8% | 18.0% | 12.2% | 0.0% |
| **අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 5.7% | 7.5% | 9.8% | 14.6% | 6.3% |
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන සහ අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 3.5% | 7.5% | 3.3% | 2.4% | 6.3% |
| **ස්වයංරැකියා** | 5.0% | 10.5% | 11.5% | 9.8% | 12.5% |
| **ගෘහස්ත මට්ටමින් සිදුවන මුදල් ඉපයීමේ කටයුතුවලට සහය දීම** | 1.3% | 1.5% | 6.6% | 0.0% | 12.5% |
| **ශිෂ්‍ය** | 30.0% | 0.8% | 0.0% | 0.0% | 0.0% |
| **රැකියා විරහිත** | 8.8% | 6.0% | 16.4% | 24.4% | 50.0% |
| **දත්ත පදනම** | 317 | 133 | 61 | 41 | 16 |

වගුව 8: සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නගේ වර්තමාන රැකියාව, වයස අනුව

| | 18-29 | 30-39 | 40-49 | 50-59 | 60+ |
|---|---|---|---|---|---|
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන** | 24.1% | 32.0% | 27.8% | 37.5% | 16.7% |
| **අර්ධ කාලීන** | 15.9% | 28.0% | 36.1% | 12.5% | 50.0% |
| **අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 6.5% | 4.0% | 5.6% | 12.5% | 16.7% |
| **විධිමත් ක්ෂේත්‍රයේ පූර්ණකාලීන සහ අවිධිමත් ක්ෂේත්‍රයේ අර්ධ කාලීන** | 3.5% | 4.0% | 8.3% | 0.0% | 0.0% |
| **ස්වයංරැකියා** | 14.1% | 14.0% | 8.3% | 37.5% | 0.0% |
| **ගෘහස්ත මට්ටමින් සිදුවන මුදල් ඉපයීමේ කටයුතුවලට සහය දීම** | 1.2% | 0.0% | 0.0% | 0.0% | 0.0% |
| **ශිෂ්‍ය** | 18.8% | 2.0% | 0.0% | 0.0% | 0.0% |
| **රැකියා විරහිත** | 15.9% | 16.0% | 13.9% | 0.0% | 16.7% |
| **දත්ත පදනම** | 170 | 50 | 36 | 8 | 6 |

## ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය රැකියාවක් ලබාගැනීමට බාධාවක්ද?

සමස්තයක් වශයෙන් සැලකූ විට, තමන්ගේ ලිංගික දිශානතිය සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය රැකියාවක් ලබාගැනීමට බාධාවක් වූවා දැයි විමසූ විට ස්ථීතික සමාජභාවිය **(77.6%)** සහ සංක්‍රාන්ති සමාජභාවී **(46.7%)** ප්‍රජාවෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් "නැත" යනුවෙන් ප්‍රතිචාර දක්වා ඇත. [කරුණාකර පහත ඇති **5** සහ **6** සටහන් බලන්න]

ස්ථීතික සමාජභාවිය සමරිසි ගැහැණු, සමරිසි පිරිමි හෝ ද්විරිසි පිරිමි හෝ ගැහැණු යැයි තමන්ව හඳුනාගත් පිරිසගේ දත්ත විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ රැකියාවක් ලබාගැනීමේදී ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය ගැටලුවක් වූ බව වැඩිපුරම පවසා ඇත්තේ ස්ථීතික සමාජභාවිය සමරිසි ගැහැණු (28.6%) අය බවයි. ස්ථීතික සමාජභාවිය ද්විරිසි පිරිමි සහ ගැහැණු ප්‍රතිචාර දක්වන්නන්ගෙන් වැඩි ප්‍රතිශතයක් (87.5%) කියා සිටියේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය රැකියා ලබාගැනීමේදී බාධාවක් වී නොමැති බවයි. [කරුණාකර පහත ඇති සටහන 5 බලන්න]

සැලකිය යුතු කරුණක් වන්නේ, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවෙන් බහුතරයකට ආසන්න ප්‍රමාණයක් (47.4%) පවසන්නේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය රැකියාවක් ලබාගැනීමේදී බාධාවක් වී ඇති බවයි. මෙය, ස්ථීතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන් සමග සංසන්දනය කළ විට ඉතා ඉහළ ප්‍රතිශතයකි. සංක්‍රාන්ති සමාජභාවී-විෂමරිසි පිරිසෙන් ඉහළ ප්‍රතිශතයක් (49.3%) දරන මතය වන්නේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය රැකියාවක් ලබාගැනීමේදී බාධාවක් වී ඇති බවයි. සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු සහ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි ප්‍රජාවන් නියෝජනය කරන ප්‍රතිචාර දක්වන්නන් මීට සමාන මතයක් දරයි. [කරුණාකර පහත ඇති **5** සහ **6** සටහන් බලන්න]

සටහන 5: රැකියාවක් ලබාගැනීමේදී ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය කිසිඳු අවස්ථාවකදී ස්ථීතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන්ට බාධාවක් වී ඇත්ද?



සටහන 6: රැකියාවක් ලබාගැනීමේදී ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය කිසිඳු අවස්ථාවකදී සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන්ට බාධාවක් වී ඇත්ද?




## වර්තමාන හෝ පෙර සේවා ස්ථානයකදී තරඟකාරී වැටුපක් ලබාගැනීමට ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය බාධාවක් වූවාද?

සමස්තයක් වශයෙන් සැලකූ විට, ස්ථිතික සමාජභාවිය ප්‍රජාවේ සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, සහ ද්විරිසි පිරිමි සහ ගැහැණු (70.4%) සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, ද්විරිසි පිරිමි සහ ගැහැණු, සහ විෂමරිසි (51.5%) ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉහළ පිරිසක් පැවැසුවේ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාවය වර්තමාන සේවා ස්ථානයේදී හෝ පෙර සේවා ස්ථානයකදී තරඟකාරී වැටුපක් ලැබීමට බාධාවක් නොවූ බවයි. [කරුණාකර පහත ඇති සටහන 7 බලන්න]

කෙසේවෙතත්, සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රතිචාර දක්වන්නන්ට වඩා සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ ප්‍රතිචාර දක්වන්නන් ඉහළ ප්‍රතිශතයක් (**34.8%**) පවසා තිබුණේ ඔවුන් ඔවුන්ගේ වර්තමාන හෝ අතීත සේවා ස්ථානවල තරඟකාරී වැටුපක් ලබාගැනීමේ දී බාධාවන්ට මුහුණ දී ඇති බව යි **[**කරුණාකර පහත ඇති **7** සහ **8** සටහන් බලන්න]

වර්තමාන හෝ පෙර සේවා ස්ථානයකදී තරඟකාරී වැටුපක් ලබාගැනීම සම්බන්ධයෙන් බාධා ඇතිවූ බව පවසන පිරිසෙන් බහුතරය වන්නේ සංක්‍රාන්ති සමාජභාවී විෂමරිසි (37.1%) සහ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි (36.2%) යි. [කරුණාකර පහත ඇති සටහන 8 බලන්න]

**සටහන 7: ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රජාවට වර්තමාන හෝ පෙර සේවා ස්ථානයකදී තරගකාරී වැටුපක් ලබාගැනීමට බාධාවක්ද?**




**සටහන 8: ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාවය සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට වර්තමාන හෝ පෙර සේවා ස්ථානයකදී තරගකාරී වැටුපක් ලබාගැනීමට බාධාවක්ද?**




## දැනට රැකියාවක නිරත වන්නේ නම්, ඔබගේ වත්මන් රැකියාව ඔබ අපේක්ෂා කළ ආකාරයේ රැකියාවක්ද, එසේත් නැත්නම් විකල්ප නොමැතිකම හේතුවෙන් ඔබ මෙම රැකියාව තොරාගත්තාද?

ස්ත්‍රීතික සමාජභාවිය සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන් දෙකෙන්ම ලැබුණු ප්‍රතිචාරවලට සමාන රටාවක් ඇති බව පෙනී යයි. සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රතිචාර දක්වන්නන් සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගේ වර්තමාන රැකියාව ඔවුන් කැමති එකක් නොවන නමුත් ඔවුන්ට ලබා ගත හැකි වූ එකම රැකියාව එය යන මතය ස්ත්‍රීතික සමාජභාවිය -සමරිසි පිරිමි ප්‍රජාවේ ඉහළ ප්‍රතිශතයක් දරයි. සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සැලකූ විට, සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි ගැහැණු (34.5%) හෝ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි (32.8%) ලෙස තමන්ව හඳුනාගත් බොහෝ ප්‍රතිචාර දක්වන්නන්ගේ මතය වූයේ ඔවුන් දැනට සේවයේ යෙදී සිටින රැකියා ඔවුන් අපේක්ෂා කළ ආකාරයේ ඒවා නොවුනත් ඔවුන් එම රැකියාවල නියුතුව සිටින්නේ ඔවුන්ට ලබාගැනීමට හැකිවූ එකම රැකියාව බැවිනි. සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව තුළ වර්තමාන රැකියාවේ නියැලීමට තමන්ට බලපෑම් එල්ල වී ඇති බව පවසන අයගෙන් බහුතරයක් සංක්‍රාන්ති සමාජභාවී-ද්විරිසි (පිරිමි හෝ ගැහැණු) අයයි. [කරුණාකර පහත ඇති 9 සහ 10 වගු බලන්න]

වගුව **9 :** සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රතිචාර දක්වන්නන් - දැනට රැකියාවක නියැලී සිටීනම්, ඔබගේ වර්තමාන රැකියාව ඔබ ලබාගැනීමට කැමැත්තෙන් සිටි ආකාරයක රැකියාවක්ද, නැතිනම් ඔබ මේ රැකියාව තෝරාගත්තේ වෙනත් විකල්ප නොමැති නිසාද?

| | **සමස්ත ස්ත්‍රීතික සමාජභාවිය** | **සමරිසි ගැහැණු** | **සමරිසි පිරිමි** | **ද්විරිසි පිරිමි හෝ ද්විරිසි ගැහැණු** |
|---|---|---|---|---|
| **ඔව්, මේ මම කැමැත්තෙන් සිටි රැකියාවයි** | 44.9 | 52.0% | 44.4% | 41.8% |
| **නැහැ, නමුත්, මා හට ලබාගැනීමට හැකිවූ එකම රැකියාව මෙය බැවින් මෙහි නියැලී සිටිමි** | 20.6 | 12.2% | 23.1% | 21.2% |
| **නැහැ, මෙම රැකියාව කරන ලෙස මා හට පීඩනයක් එල්ල වූවා** | 3.3 | 3.1% | 4.2% | 2.2% |
| **අදාළ නොවේ** | 23.9 | 29.6% | 21.0% | 25.5% |
| **දන්නේ නැහැ** | 7.2 | 3.1% | 7.3% | 9.2% |
| **දත්ත පදනම** | 568 | 98 | 286 | 184 |

වගුව **10:** සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන් - දැනට රැකියාවක නියැලී සිටීනම්, ඔබගේ වර්තමාන රැකියාව ඔබ ලබාගැනීමට කැමැත්තෙන් සිටි ආකාරයක රැකියාවක්ද, නැතිනම් ඔබ මේ රැකියාව තෝරාගත්තේ වෙනත් විකල්ප නොමැති නිසාද?

| | **සමස්ත සංක්‍රාන්ති සමාජභාවී** | **සමරිසි ගැහැණු** | **සමරිසි පිරිමි** | **ද්විරිසි පිරිමි හෝ ද්විරිසි ගැහැණු** | **විෂමරිසි** | **වෙනත්** |
|---|---|---|---|---|---|---|
| **ඔව්, මේ මම කැමැත්තෙන් සිටි රැකියාවයි** | 49.6 | 24.1% | 51.7% | 38.1% | 57.9% | 36.4% |
| **නැහැ, නමුත්, මා හට ලබාගැනීමට හැකිවූ එකම රැකියාව මෙය බැවින් මෙහි නියැලී සිටිමි** | 24.4 | 34.5% | 32.8% | 23.8% | 19.3% | 22.7% |
| **නැහැ, මෙම රැකියාව කරන ලෙස මා හට පීඩනයක් එල්ල වූවා** | 5.6 | 3.4% | 3.4% | 9.5% | 6.4% | 4.5% |
| **අදාළ නොවේ** | 16.3 | 27.6% | 8.6% | 19.0% | 14.3% | 31.8% |
| **දන්නේ නැහැ** | 4.1 | 10.3% | 3.4% | 9.5% | 2.1% | 4.5% |
| **දත්ත පදනම** | 270 | 29 | 58 | 21 | 140 | 22 |

# තුන්වැනි පරිච්ඡේදය: දේශපාලන සහභාගීත්වය

*ප්‍රතිචාර දක්වන්නන්ට තෝරාගත් දේශපාලන ක්‍රියාකාරකම් ලැයිස්තුවක් (දේශපාලන සහභාගීත්වයේ විවිධ වූ ආකාර අතුරින්) ලබා දුන් අතර, එහි සඳහන් එකදු ක්‍රියාකාරකමකට හෝ සහභාගී වී ඇත්ද යන්න සඳහන් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේය. සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ (වර්තමාන) තත්වය මැනීමේදී තීරණාත්මක ලෙස සැලකිය හැකි ක්‍රියාකාරකම් කිහිපයක් මෙන්ම ජනතාවගේ කැමැත්ත අවධාරණය කෙරෙන පාලන ක්‍රමයක් ඇතිකිරීමට බලපෑම් කෙරෙන සිවිල් ක්‍රියාකාරකම් කිහිපයක් පර්යේෂණය තුළින් හඳුනා ගන්නා ලදී. මෙය සම්පූර්ණ ලැයිස්තුවක් නොවුනත්, මෙම ප්‍රජාවේ පුද්ගලයින් නිරත වීමට තෝරාගත් සිවිල් සහ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විශ්ලේෂණයක් මින් සපයයි.*

දත්ත විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන්නේ, තම ප්‍රදේශයේ පැවැත්වෙන දේශපාලන රැස්වීම්/රැලිවලට සහභාගී වීම, විරෝධතාවලට සහභාගී වීම, තම ප්‍රදේශයේ ගැටලුවක් විසඳා ගැනීමට හෝ මුහුණ දුන් අසාධාරණ අත්දැකීමක්/වෙනස්කොට සැලකීමක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට රජයේ නිලධාරියකු හමුවීම ආදී ක්‍රියාකාරකම් අවධානයට ගත් විට, ස්ථිතික සමාජභාවිය ප්‍රජාවේ සමරිසි ගැහැණු, සමරිසි පිරිමි හෝ ද්විරිසි පිරිමි හෝ ගැහැණු ප්‍රතිචාර දක්වන්නන් සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, ද්විරිසි පිරිමි හෝ ගැහැණු, සහ විෂමරිසි ප්‍රතිචාර දක්වන්නන්ට වඩා ක්‍රියාශීලී බව යි. [කරුණාකර පහත ඇති 11 සහ 12 වගු බලන්න]

වගුව 11: ස්ථිතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන් අතර විවිධ දේශපාලන ක්‍රියාකාරකම්වලට සහභාගී වීම

| ස්ථිතික සමාජභාවිය | ඔව් % | නැහැ % |
|---|---|---|
| මාගේ ප්‍රදේශයේ පැවැත්වෙන දේශපාලන රැස්වීම්/රැලි | 45.1 | 54.9 |
| විරෝධතාවයකට සහභාගී වී ඇත | 50.9 | 49.1 |
| මාගේ ප්‍රදේශයේ පවතින ගැටලුවක් විසඳාගැනීම සඳහා රාජ්‍ය නිලධාරියෙකු හමුවූවා | 48.2 | 51.8 |
| ඔබට මුහුණපෑමට සිදුවූ වෙනස්කොට සැලකීමක් හෝ අසාධාරණ සිදුවීමක් පිළිබඳ පැමිණිලි කිරීමට දේශපාලනඥයෙකු හෝ රාජ්‍ය නිලධාරියෙකු හමුවූවා | 26.4 | 73.6 |
| දත්ත පදනම | 568 | |

වගුව 12: සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන් අතර විවිධ දේශපාලන ක්‍රියාකාරකම්වලට සහභාගී වීම

| සංක්‍රාන්ති සමාජභාවීය | ඔව් % | නැහැ % |
|---|---|---|
| මාගේ ප්‍රදේශයේ පැවැත්වෙන දේශපාලන රැස්වීම්/රැලි | 28.9 | 71.1 |
| විරෝධතාවයකට සහභාගී වී ඇත | 40.0 | 60.0 |
| මාගේ ප්‍රදේශයේ පවතින ගැටලුවක් විසඳාගැනීම සඳහා රාජ්‍ය නිලධාරියෙකු හමුවූවා | 33.7 | 66.3 |
| ඔබට මුහුනුපෑමට සිදුවූ වෙනස්කොට සැලකීමක් හෝ අසාධාරණ සිදුවීමක් පිළිබඳ පැමිණිලි කිරීමට දේශපාලනඥයෙකු හෝ රාජ්‍ය නිලධාරියෙකු හමුවූවා | 23.3 | 76.7 |
| දත්ත පදනම | 270 | |

## දේශපාලන රැස්වීම්/රැලිවලට සහභාගී වීම

සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවට අයත් ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් ඔවුන් ජීවත් වන ප්‍රදේශවල පැවැත්වෙන දේශපාලන රැස්වීම්/රැලි වලට සහභාගී වී නොමැති බව පවසන අතර, ස්ථිතික සමාජභාවිය ප්‍රජාවෙන් එවැනි අදහසක් ප්‍රධාන වශයෙන්ම මතු කළේ ස්ථිතික සමාජභාවිය සමරිසි ගැහැණු (58.2%) සහ ස්ථිතික සමාජභාවිය ද්විරිසි පිරිමි සහ ගැහැණු (54.9%) ප්‍රතිචාර දක්වන්නන් වේ. [කරුණාකර පහත ඇති 9 සහ 10 සටහන් බලන්න]

**සටහන 9:** ස්ථිතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන් දේශපාලන රැස්වීම්/රැලි වලට සහභාගී වීම




**සටහන 10:** සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන් දේශපාලන රැස්වීම්/රැලි වලට සහභාගී වීම




## විරෝධතාවලට සහභාගී වීම

ස්ථිතික සමාජභාවිය ප්‍රජාවේ සමරිසි ගැහැණු, සමරිසි පිරිමි සහ ද්විරිසි පිරිමි හෝ ගැහැණු ප්‍රතිචාර දක්වන්නන්ගෙන් වැඩි ප්‍රතිශතයක් විරෝධතාවලට සහභාගී වී ඇති බව දත්ත විශ්ලේෂණයෙන් පෙනී යයි. කෙසේනමුත්, ස්ථිතික සමාජභාවිය ප්‍රජාවේ සමරිසි පිරිමි සහ ද්විරිසි පිරිමි සහ ගැහැණු ප්‍රතිචාර දක්වන්නන්ට වඩා ස්ථිතික සමාජභාවිය සමරිසි ගැහැණු ප්‍රතිචාර දක්වන්නන්ගෙන් වැඩි ප්‍රතිශතයක් විරෝධතාවලට සහභාගී වී නොමැති බව කියා සිටී.

සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සම්බන්ධයෙන් ගත් කල, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ සමරිසි ගැහැණු, සමරිසි පිරිමි, ද්විරිසි පිරිමි හා ගැහැණු, සහ විෂමරිසි පුද්ගලයින් අතර කැපී පෙනෙන බහුතරයක් පවසන්නේ විරෝධතාවලට සහභාගී වී නොමැති බවයි. [කරුණාකර පහත ඇති 11 සහ 12 සටහන් බලන්න]

**සටහන 11:** ස්ත්‍රීතික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන් විරෝධතාවලට සහභාගී වීම




**සටහන 12:** සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන් විරෝධතාවලට සහභාගී වීම



## ගැටලුවක් විසඳාගැනීමට රජයේ නිලධාරියෙකු හමුවීම

සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවේ ප්‍රතිචාර දක්වන්නන්ට වඩා වැඩි සංක්‍රාන්ති සමාජභාවී නොවන ප්‍රජාවේ ප්‍රතිචාර දක්වන්නන් ගණනක් තම ප්‍රදේශයේ ගැටලුවක් විසඳාගැනීම සඳහා රජයේ නිලධාරියෙකු හමු වී ඇති බව ප්‍රකාශ කරයි. තමන් එසේ කර නොමැති බව වැඩිපුරම පවසන්නේ සංක්‍රාන්ති සමාජභාවී නොවන සමරිසි ගැහැණු ප්‍රතිචාර දක්වන්නන් (61.2%) වන නමුත්, සංක්‍රාන්ති සමාජභාවී නොවන සමරිසි පිරිමි ප්‍රජාවෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (51%) මෙම ප්‍රතිචාරය ලබාදී ඇත. [කරුණාකර පහත ඇති **සටහන** 13 බලන්න]

තවද, සංක්‍රාන්ති සමාජභාවී-විෂමරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී-සමරිසි පිරිමි ප්‍රතිචාර දක්වන්නන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පවසා සිටියේ ඔවුන් තම ප්‍රදේශයේ ගැටලුවක් විසඳාගැනීම සඳහා රජයේ නිලධාරියෙකු හමු වී නොමැති බවයි. [කරුණාකර පහත ඇති **සටහන** 14 බලන්න]

**සටහන 13:** ස්ත්‍රීලිංගික සමාජභාවිය ප්‍රතිචාර දක්වන්නන් - තම ප්‍රදේශයේ ගැටලුවක් විසඳාගැනීම සඳහා රජයේ නිලධාරියෙකු හමු වී ඇත




**සටහන 14:** සංක්‍රාන්ති සමාජභාවී ප්‍රතිචාර දක්වන්නන් - තම ප්‍රදේශයේ ගැටලුවක් විසඳාගැනීම සඳහා රජයේ නිලධාරියෙකු හමු වී ඇත



## වෙනස්කොට සැලකීමක් හෝ අසාධාරණයක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට දේශපාලනඥයෙකු හෝ රජයේ නිලධාරියෙකු හමුවීම

